# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1840/12 - 2013 දෙසැම්බර් මස 09 වැනි සඳුදා - 2013.12.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : CI/1602/2001.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.06.14 වැනි දිනැති හා අංක 1762/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2012.06.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර, වීර මාවත, නො. 12/2 හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය හා අනෙක් පාර්ශ්වය වශයෙන් රත්මලාන, කඳවල පාර, අංක 72 සී හි පිහිටි ඩේන්ටි ෆුඩ්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.10.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 නොවැම්බර් මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : CI/1602/2001.

කාර්මික අධිකරණයේ දී ය.

එක් පාර්ශ්වයක් වශයෙන්,

අන්තර් සමාගම් සේවක සංගමය,
නො. 12/2, වීර මාවත,
ශ්‍රී සුභූති පුර,
බත්තරමුල්ල.

නඩු අංකය : ඒ/3456

අනෙක් පාර්ශ්වය වශයෙන්

ඩේන්ටි ෆුඩ්ස් ලිමිටඩ්,
අංක 72 සී, කඳවල පාර,
රත්මලාන.

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් වැඩ බලන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ජගත් බාලසූරිය අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2012.06.06 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

දෙපාර්ශ්වය අතර පවත්නා ආරවුල මෙසේය.

01. ඩේන්ටි ෆුඩ්ස් ලිමිටඩ් විසින් 2001.01.15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයට අමුණා ඇති 01 උපලේඛනයේ නම් සඳහන් එහි කර්මාන්තශාලා සේවකයින් දෙසිය දහ (210) දෙනාගේ සේවය අවසන් කිරීම යුක්තිසහගතද යන්න හා ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමි ද යන්න හා,


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. ඩේන්ටි ෆුඩ්ස් ලිමිටඩ් විසින් 2001.01.10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයට අමුණා ඇති 02 උපලේඛනයේ නම් සඳහන් එහි කර්මාන්තශාලා සේවකයින් හතර (04) දෙනා සේවයෙහි නොයෙදවීම යුක්තිසහගතද යන්න හා ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමි ද යන්නත් පිලිබඳව වේ.

දෙපාර්ශ්වය ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙම ආරවුලට දීර්ඝ කාලයක් ගතවීම මත සමථයක් පිළිබඳව කටයුතු කිරීම සඳහා පාර්ශ්වයන් බේරුම්කරණයේදී එකඟ විය. සේවකයින් 214 දෙනෙකුගේ සේවය අවසන් කිරීම මත පදනම්ව මෙම ආරවුල බේරුම්කරණයට යොමු කර ඇත. මෙම ආරවුල බේරුම්කරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශ්වය රිට් ආඥාවක් ලබා ගැනීමට අභියාචනාධිකරණයට ඉදිරිපත්වීම හේතු කොට ගෙන අදාළ නියෝගයක් ලබාදීම සඳහා වසර 09 ක පමණ කාලයක් ගතවී ඇත.

මෙම යොමු කිරීමේ පළමු පාර්ශ්වය අන්තර් සමාගම් සේවක සංගමය වන හෙයින් යොමු කිරීමට අදාළ ඉල්ලුම්කරුවන්ගේ පුද්ගලික ලිපිනයන් ඉදිරිපත්ව නැත. මෙම ආරවුලට අදාළ සියලුම සේවකයින් කැඳවීමට අදාළ වෘත්තීය සමිතිය පියවර ගැනීමෙන් අනතුරුව පැමිණි ඉල්ලුම්කරුවන් සමඟ මෙම ආරවුල සමථයට පත් කිරීමට පාර්ශ්වයන් බේරුම්කරණයේදී එකඟ විය. මෙම ආරවුල සම්බන්ධයෙන් සේවකයින් 61 දෙනෙකු පෙනී සිටි අතර, අනෙක් සේවකයින් නොපැමිණීම සම්බන්ධව පිළිගත හැකි හේතු ඉදිරිපත් කිරීමටද ඉල්ලුම්කාර පාර්ශ්වය අපොහොසත් විය. මෙම ආරවුලට යොමු කර ඇති ඩී. එල්. ඕ. සී. පීරිස් යන සේවකයා කම්කරු විනිශ්චය සභාවට ද විය. මෙම ආරවුල සම්බන්ධයෙන් සේවකයින් 61 දෙනෙකු පෙනී සිටි අතර, අනෙක් සේවකයින් නොපැමිණීම සම්බන්ධව පිළිගත හැකි හේතු ඉදිරිපත් කිරීමට ද ඉල්ලුම්කාර පාර්ශ්වය අපොහොසත් විය. මෙම ආරවුලට යොමු කර ඇති ඩී. එල්. ඕ. සී. පීරිස් යන සේවකයා කම්කරු විනිශ්චය සභාවට ද ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සමථයට පත්ව තිබූ බවටද කරුණු බේරුම්කරණයට ඉදිරිපත් විය.

2013.02.14 වැනි දින මෙම ආරවුල බේරුම්කරණයේදී කැඳවූ අවස්ථාවේදී ඉල්ලුම්කාර පාර්ශ්වය මෙම ආරවුල සම්බන්ධයෙන් සේවකයින් 59 දෙනෙක් පැමිණි බවට අත්සන් කිරීමේ ලේඛනයක් භාරදෙන ලදී. ඒ අනුව එම සේවකයින් සම්බන්ධයෙන් සමථය සඳහා කටයුතු කිරීමට පාර්ශ්වයන් එකඟ විය.

මෙදින මිය ගිය පුද්ගලයෙකු වෙනුවෙන් බිරිඳ ආදේශ කරන බව පළමු පාර්ශ්වය දැනුම් දෙන ලදී.

ජයසුන්දර නැමති ඉල්ලුම්කරු විදේශ ගතවීම හේතු කොට ගෙන ඔහුගේ බිරිඳ ඇටර්නි බල පත්‍රයක් ඉදිරිපත් කරන බවද පළමු පාර්ශ්වය දැනුම් දෙන ලදී.

2013.05.16 වැනි දින නැවත මෙම ආරවුල කැඳවූ අවස්ථාවේදී ඩබ්. එම්. වසන්ත ප්‍රියලාල් යන සේවකයා මිය ගොස් ඇති බැවින් ඔහුගේ බිරිඳ වන ඩිලානි දර්ශනී ඔහු වෙනුවට ආදේශ කරන බව පළමු පාර්ශ්වය එදින දැනුම් දෙන ලදී.

මෙදින දෙපාර්ශ්වය මෙම ආරවුල සමථයට පත් කිරීමට බේරුම්කරණයේදී එකඟ විය. එකඟ වූ සමථය පරිදි 2013.07.25 වැනි දින චෙක්පත් මගින් මුදල් ගෙවා ආරවුල සමථයට පත් විය. ඊට අදාළ විස්තර මෙසේය.

| | නම | | ගෙවන ලද මුදල |
|---|---|---|---|
| 01. | සමීර පට්ටිදොර | රු. | 52,500 |
| 02. | චන්දන ජගත් මීපගේ | රු. | 55,300 |
| 03. | ජී. ජී. ඉන්ද්‍රජිත් කුමාර | රු. | 53,200 |
| 04. | එච්. ඩී. ලාල් ප්‍රේමරත්න | රු. | 37,012.50 |
| 05. | එච්. ඒ. තනුජ ලක්මාල් | රු. | 37,012.50 |
| 06. | සී. එල්. කේ. කේ. අමරවික්‍රම | රු. | 37,275 |
| 07. | ඒ. ඩබ්. අතුල වික්‍රම | රු. | 39,112.50 |
| 08. | එච්. කේ. රංජිත් ලසන්ත | රු. | 35,700 |
| 09. | එච්. ජී. යූ. අයි. හෙට්ටිගොඩ | රු. | 35,700 |
| 10. | ඩබ්. ජී. ඒ. පී. ගුණවර්ධන | රු. | 35,700 |
| 11. | ඊ. ඒ. සුසන්ත | රු. | 35,700 |
| 12. | එච්. කේ. අනුර ජයන්ත | රු. | 23,800 |
| 13. | ටී. කේ. සුමේද | රු. | 23,800 |
| 14. | ඩබ්. ඒ. සමන්ත | රු. | 23,800 |
| 15. | ඒ. චින්තක ප්‍රියංකර | රු. | 23,800 |
| 16. | ජේ. ඒ. සී. ටී. ජයසිංහ බණ්ඩාර | රු. | 90,712.50 |
| 17. | එච්. එම්. ආනන්ද හේරත් බණ්ඩාර | රු. | 91,225 |
| 18. | රොෂාන් සිසිර කුමාර | රු. | 78,162.50 |
| 19. | ආර්. ජයකුමාර | රු. | 74,000 |
| 20. | ඩී. නන්දසේන | රු. | 65,175 |
| 21. | ආර්. ජයන්ත | රු. | 83,737.50 |
| 22. | කේ. ඩී. රුවන් ප්‍රසංග | රු. | 67,237.50 |
| 23. | ජේ. කේ. ජයනන්ද | රු. | 65,237.50 |
| 24. | ඩබ්. පී. නන්දන නවරත්න | රු. | 70,537.50 |
| 25. | ඩබ්. රුක්මන් ජෝසප් | රු. | 70,950 |
| 26. | එච්. එන්. ප්‍රියාන් කුමාර | රු. | 100,237.50 |
| 27. | එච්. චාමින්ද උදයකුමාර | රු. | 98,587.50 |
| 28. | එච්. කේ. සුනිමල් | රු. | 60,900 |
| 29. | එම්. ඩී. ආර්. පුෂ්පකුමාර | රු. | 56,187.50 |
| 30. | එච්. එම්. එස්. බණ්ඩාර | රු. | 62,712.50 |
| 31. | ජී. ජගත් වීරරත්න | රු. | 58,362.50 |
| 32. | එච්. එම්. ඒ. සමන්ත | රු. | 57,637.50 |
| 33. | ජී. විල්සන් ප්‍රේමරත්න | රු. | 59,087.50 |
| 34. | ඩබ්. ජී. අජිත් වීරසිංහ | රු. | 50,937.50 |
| 35. | එච්. ඒ. අනුර ශාන්ත | රු. | 50,625 |
| 36. | කේ. ඩී. ඉන්දික කුමාර ජයසිංහ (එච්. එල්. නිරෝෂා දමයන්ති - බිරිඳ) | රු. | 53,437.50 |
| 37. | කේ. පී. අමරසිංහ | රු. | 52,812.50 |
| 38. | ඩබ්. ජී. උපුල් ජානක | රු. | 53,125 |
| 39. | පී. බී. සී. ප්‍රනාන්දු | රු. | 53,900 |
| 40. | බී. ආර්. උදය කුමාර | රු. | 37,012.50 |
| 41. | ජේ. පී. රූපසේන | රු. | 37,275 |
| 42. | එස්. එම්. ජයවර්ධන | රු. | 37,012.50 |
| 43. | ඒ. එච්. සමන් නිශාද් කුමාර | රු. | 37,275 |
| 44. | කේ. කේ. අමිල ඉන්දික | රු. | 37,275 |
| 45. | ඩබ්. එම්. වසන්ත ප්‍රියලාල් (දිලානි දර්ශනි - බිරිඳ) | | |

| | නම | | ගෙවන ලද මුදල |
|---|---|---|---|
| 46. | යූ. ආර්. මහේෂ් ආනන්ද | රු. | 23,800 |
| 47. | කේ. ඩී. එච්. පුෂ්පකුමාර (විදේශ ගත වී ඇත) (එල්. ජයසුන්දර - බිරිඳ) | | 23,800 |
| 48. | එච්. ඒ. ශාමලි දිල්හානි | රු. | 11,900 |
| 49. | කේ. ඒ. අනුර ප්‍රදීප් | රු. | 11,900 |
| 50. | කේ. උපාලි තිලකරත්න | රු. | 11,900 |
| 51. | එම්. ජී. එම්. ලීලාන් පෙරේරා | රු. | 11,900 |
| 52. | අයි. ඩී. චන්ද්‍රන දිසානායක | රු. | 11,900 |
| 53. | ටී. ජේ. ආර්. කේ. සමරවීර | රු. | 11,900 |
| 54. | එම්. රුවන් ප්‍රියලාල් | රු. | 11,900 |
| 55. | එච්. ඩී. පුෂ්පසිරි | රු. | 11,900 |
| 56. | කේ. පී. මනෝජ් සාරංග | රු. | 11,900 |
| 57. | ඒ. පී. සපුතන්ත්‍රි | රු. | 11,900 |
| 58. | ඒ. ආර්. එස්. පෙරේරා | රු. | 11,900 |
| 59. | එච්. ජී. රුවන් සංජීව | රු. | 11,900 |
| 60. | එච්. චාමින්ද උදයකුමාර | රු. | 8,500 |
| 61. | අජන්ත විජේසිංහ ආර්. ඒ. | රු. | 8,500 |

2013.07.25 වැනි දින ඉහත පරිදි මුදල් ගෙවීමෙන් අනතුරුව නැවත සේවකයින් දෙදෙනෙකු වෙනුවෙන් මුදල් ගෙවීමට මෙම නඩුව 2013.08.16 වැනි දින නැවත කැඳවන ලදී. ජේ. වී. සී. විතාන යන සේවකයාට රු. 69,000 ක වන්දි මුදලක් සමඟ පාරිතෝෂිත වශයෙන් රුපියල් 14,400 ක මුදලට අදාළ චෙක්පත් බේරුම්කරණයේදී ගෙවන ලදී. ජේ. කේ. ඒ. ඔක්ස්මන් මහතාට හිමි පාරිතෝෂිත මුදල ගෙවූ බව වගඋත්තරකරු කියයි. ඒ පිළිබඳව සොයා බලා නොගෙවා ඇත්නම් කම්කරු කොමසාරිස් මගින් කටයුතු කල හැකි බව කියා සිටියි. ඔහුට හිමි වන්දි මුදල වන රු. 80,937.50 ක මුදලට අදාළ චෙක්පත ලබාදීමට පියවර ගන්නා ලදී. මියගිය නන්දසේන මහතාට හිමි මුදල ලබා ගැනීමට ඔහුගේ බිරිඳ පැමිණ නොසිටි අතර, එකී මුදල ඇයට ලබාදීමට වගඋත්තරකරු එකඟවන අතර, වෘත්තීය සමිතියද ඊට එකඟත්වය පළ කර සිටින ලදී.

ඉහත සේවකයින්ට එකඟ වූ පරිදි වන්දි මුදල් හා සේවා කාලයට හිමි පාරිතෝෂිත මුදල්ද වගඋත්තරකරු ගෙවයි. සේවකයින්ද එම මුදල් බේරුම්කරණයේදී ලබා ගන්නා ලදී. ඉහත මුදල් ලබා ගැනීමෙන් අනතුරුව මෙම ආරවුල සමථයට පත් කර ගැනීමට අදාළව දෙපාර්ශ්වය නඩු ගොනුවට අත්සන් තබන ලදී. යොමු කරන ලද සෙසු සේවකයින්ට අදාළව ආරවුල විසඳා ගැනීම සඳහා නොපැමිණීම මත මෙම ඉල්ලීම් සම්බන්ධව උනන්දුවක් නොදක්වන සේ සලකා කටයුතු කිරීමට පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය බේරුම්කරණයේදී එකඟ විය. ඒ අනුව එම ඉල්ලුම්පත් සම්බන්ධයෙන් ප්‍රදානයක් නොකරමි.

ඉහත සේවකයින්ට ලබා දෙන ලද වන්දි මුදල සාධාරණ හා යුක්තිසහගත ප්‍රදානයක් වන හෙයින් මෙම ආරවුල සමථයකට පත් කරමි.

පාලිත වීරසේකර,
(බේරුම්කරු)

2013.10.10

12-1033

---

මගේ අංකය : IR/15/05/2011.
IR/15/08/2007.

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.06.15 වැනි දිනැති හා අංක 1762/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.06.11 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස්, ශාන්ත ජෝෂප් වීදිය, 65/7 හි පදිංචි ඩබ්ලිව්. එන්. ගයාත්‍රි මිය / දෙහිවල, අත්තිඩිය, සමගි මාවත, 19/2 හි පදිංචි ආර්. එම්. එම්. අයි. රණසිංහ මයා / මීගමුව, පී. ඒ. ප්‍රනාන්දු මාවත, පොලිස් නිවාස, නො. 05 හි පදිංචි පී. එච්. උපුල් ප්‍රියන්ත ද සිල්වා මයා / බෝම්බුවල, මානාන, ඩී. එස්. ඩී. ගුණවර්ධන බාරේ හි පදිංචි එම්. ඒ. ආර්. ප්‍රසාද් මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 08, ඇල්විටිගල මාවත, නො. 276 හි පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.09.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 නොවැම්බර් මස 14 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/15/05/2011.
IR/15/08/2007.

කාර්මික අධිකරණයේ දී ය

01. ඩබ්ලිව්. එන්. ගයාත්‍රි මිය,
65/7, ශාන්ත ජෝෂප් වීදිය,
ග්‍රෑන්ඩ්පාස්,
කොළඹ 14.

02. ආර්. එම්. එම්. අයි. රණසිංහ මයා,
19/2, සමඟි මාවත,
අත්තිඩිය,
දෙහිවල.

නඩු අංකය : ඒ/3457

03. පී. එච්. උපුල් ප්‍රියන්ත ද සිල්වා මයා,
නො. 05, පොලිස් නිවාස,
පී. ඒ. ප්‍රනාන්දු මාවත,
මීගමුව.

04. එම්. ඒ. ආර්. ප්‍රසාද් මයා,
ඩී. එස්. ඩී. ගුණවර්ධන බාරේ,
මානාන,
බෝම්බුවල.

*(ඉල්ලුම්කරුවෝ)*

සහ

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
නො. 276, ඇල්විටිගල මාවත,
කොළඹ 08.

*(වගඋත්තරකරු)*

සමථ කිරීමේ ප්‍රදානය

වැඩ බලන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ජගත් බාලසූරිය මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ :-

01. "ඩබ්. එන්. ගයාත්‍රි මිය, ආර්. එම්. එම්. අයි. රණසිංහ මයා, පී. එච්. උපුල් ප්‍රියන්ත ද සිල්වා මයා සහ එම්. ඒ. ආර්. ප්‍රසාද් මයා යන අය 2002.09.02 දින සිට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලිපිකරුවන් වශයෙන් සේවයේ ස්ථිර නොකිරීම හා

02. එදින සිට බලපවත්වන පරිදි ඔවුන්ට හිමි විය යුතු හිඟ වැටුප් හා වෙනත් ව්‍යවස්ථාපිත හිමිකම් ලබා නොදීම යුක්තිසහගතද යන්න හා එසේ නොවන්නේ නම් ඔවුනට කුමන සහනයන් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ".

පාර්ශ්වයන් විසින් මෙම ආරවුලට අදාළ ඔවුන්ගේ ප්‍රකාශ සහ ප්‍රතිප්‍රකාශ බේරුම්කරණයට ඉදිරිපත් කිරීමෙන් පසු පරීක්ෂණය 2012.09.13 වැනි දින ආරම්භ කරන ලදී. එදින පාර්ශ්වයන් දෙදෙනෙකු වන ආර්. එම්. එම්. අයි. රණසිංහ සහ එම්. ඒ. ආර්. ප්‍රසාද් යන දෙදෙනා පැමිණී සිටි අතර, ඔවුන් වෙනුවෙන් නියෝජිත උපාලි කුලරත්න මහතා පෙනී සිටි අතර, වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ රුවිනි ගුණරත්න මහත්මිය පෙනී සිටියාය.

පසුව මෙම පරීක්ෂණය 2012.10.30 වැනි දින ලේඛකාධිකාරී වෙත ලිපියක් යවමින් පී. එච්. උපුල් ප්‍රියන්ත ද සිල්වා නමැති සේවකයා මෙම පරීක්ෂණයට සහභාගී නොවන බැව් දන්වා සිටියෙන් ඉතිරි සේවකයින් තිදෙනා සම්බන්ධයෙන් පමණක් පරීක්ෂණය පැවැත්වීමට මවිසින් තීරණය කරන ලදී.

2013.01.17 වැන දින සිට ඉල්ලුම්කරුවන් වෙනුවෙන් නියෝජිත ජී. ඩබ්ලිව්. ග්‍රේෂන් ද සිල්වා මහතා පෙනී සිටි අතර, වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් මධුෂානි මෙත්තා මහත්මිය පෙනී සිට ඇත.

වගඋත්තරකාර පාර්ශ්වය වන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර අධ්‍යක්ෂ (පාලන) අශෝක ගුණතිලක මහතා සවිස්තර දීර්ඝ සාක්ෂියක් 2013.01.17 වැනි දින ආරම්භ කොට දින කීපයක් සාක්ෂි දීමෙන් පසු ඉල්ලුම්කාර පාර්ශ්වයේ නියෝජිතගේ හරස් ප්‍රශ්නවලටද පිළිතුරු දීමෙන් පසු එම සාක්ෂිය අවසන් කරන ලදී.

2013.08.21 වැනි දින පරීක්ෂණය පැමිණිලිකාර පාර්ශ්වයේ නියෝජිත ග්‍රේෂන් ද සිල්වා මහතා බේරුම්කරණය වෙත කරුණු දක්වමින් 2013.08.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පැමිණිලිකරුවන් වන ඩබ්. එන්. ගයාත්‍රි, ආර්. එම්. එම්. අයි. රණසිංහ සහ එම්. ඒ. ආර්. ප්‍රසාද් යන සේවකයින්ගේ වැටුප් පරිමාණය ඔවුන් සෑහීමකට පත්වී යන ආකාරයෙන් වැඩිකර ඇති නිසා එය සැලකිල්ලට ගෙන වගඋත්තරකාර පාර්ශ්වය සහ ඉල්ලුම්කරුවන් අතර යහපත් මානසිකත්වයකින් සුහදව රාජකාරි පවත්වා ගෙන යෑමේ අභිලාෂය මත මෙම ආරවුල සමථයකට පත් කිරීමට වාතාවරණයක් උද්ගතවී ඇති බවයි. මෙම සමථය සම්බන්ධයෙන් පාර්ශ්වයන්ගේ අත්සන් සහිත ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට 2013.09.12 වැනි දින නඩුව ඇමතූ අවස්ථාවේදී ඉල්ලුම්කරුවන් තිදෙනා සහ වගඋත්තරකාර ආයතනයේ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ඩබ්. එල්. ඒ. කේ. ඒ. ගුණතිලක ලියවිල්ලක් බේරුම්කරණයට භාරදෙන ලදුව එම ලේඛන "X" වශයෙන් සලකුණු කොට ගොනු කරන ලදී.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන මෙම "X" ලියවිල්ල සමථයක් ලෙස සලකා මෙම ආරවුල අද දින අවසන් කරන ලදී. මෙය සාධාරණ සමථයක් ලෙස මම සලකමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ මෙම සමථ ප්‍රදානය පළ කිරීම සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්තුමියට භාර දෙන්න.

ටී. පියසෝම,
බේරුම්කරු.

2013.09.30

---

2013.09.10

ටී. පියසෝම මහතා
බේරුම්කරු

**නඩු අංක ඒ 3457, ආර්. එම්. එම්. අයි. රණසිංහ, ඩබ්. එන්. ගයාත්‍රි, එම් ආර්. අයි. ප්‍රසාද් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර පවත්නා ආරවුල**

අංක ඒ 3457 යටතේ වූ උක්ත බේරුම්කරණයේ පැමිණිලිකරුවන් වන අප තිදෙනා ප්‍රකාශ කර සිටින්නේ, වගඋත්තරකාර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2013 අගෝස්තු මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි එකී කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ වැටුප් පරිවර්ථනයක් කර ඇති බවත්, එම වැටුප් පරිවර්ථනයේදී ඉල්ලුම්කරුවන් වන අප තිදෙනාගේ වැටුප් ද පරිවර්ථනය කර ඇති බවත්, එමගින් අප තිදෙනාගේ මාසික වැටුප සතුටුදායක ලෙස හා තෘප්තිමත් විය හැකි ආකාරයට වැඩි වී ඇති බවත් කියා සිටිමු.

ඒ අනුව මෙම නඩුව ඉල්ලා අස්කර ගැනීමට පතයි. ඒ අනුව උක්ත බේරුම්කරණ නඩුව දෙපාර්ශ්වයේ එකඟතාවය මත අවසානයට පත්වූවා සේ සලකන ලෙසද ඉල්ලා සිටිමු.

01. ආර්. එම්. එම්. අයි. රණසිංහ
02. ඩබ්. එන්. ගයාත්‍රි
03. එම්. ආර්. අයි. ප්‍රසාද්

ඉහත පරිදි එකඟතාවය පල කරමි.

වගඋත්තරකාර ආයතනය වෙනුවෙන්,
ඩබ්. එල්. ඒ. කේ. ඒ. ගුණතිලක (සහකාර අධ්‍යක්ෂ - පාලන)

නියෝජිත
ජී. ඩබ්. ග්‍රේෂන් ද සිල්වා

12-1034

මගේ අංකය : IR/07/08/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.01.16 වැනි දිනැති හා අංක 1793/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2013.01.08 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 03, ඇලෝයි මාවත, අංක 06 හි පිහිටි ලංකා වතු සේවා සංගමය හා අනෙක් පාර්ශ්වය වශයෙන්,

1. කොළඹ 08, ඥානාර්ථ ප්‍රදීප මාවත, නො. 10 හි පිහිටි අගලවත්ත ප්ලාන්ටේෂන් පී. එල්. සී
2. කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, නො. 53-1/1 හි පිහිටි ආගරපතන ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
3. රත්නපුර, පාම්ගාඩින්, තැ.පෙ. 06 හි පිහිටි බලංගොඩ ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
4. කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාර, නො. 153 හි පිහිටි බොගවන්තලාව ටී.එස්ටේට්ස් පී.එල්.සී
5. කොළඹ 02, වොක්ෂෝල් වීදිය, නො. 305, එයිට්කන්ස්පෙන්ස් ටවර්, 9 වන මහල හි පිහිටි ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
6. කොළඹ 10, ටී. බී. ජායා මාවත, නො. 320, ජනවතු පියස හි පිහිටි ඇල්කඩුව ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
7. ඉංගිරිය, නම්බපාන, තැ.පෙ. 02 හි පිහිටි හපුගස්තැන්න ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
8. කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, නො. 08 හි පිහිටි හොරණ ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
9. කොළඹ 10, ඩින්ස් පාර, නො. 400 හි පිහිටි කැළණි වැලි ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
10. මහරගම, නාවින්න, හයිලෙවල් පාර, නො. 310 හි පිහිටි කෑගල්ල ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
11. කොළඹ 01, ශ්‍රීමත් බාරෝන් ජයතිලක මාවත, නො. 53-1/1 හි පිහිටි කොටගල ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
12. කොළඹ 10, මාලිගාවත්ත පාර, නො. 52 හි පිහිටි කහවත්ත ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
13. බදුල්ල, හිඟුරුගම සංකීර්ණය හි පිහිටි මඩොල්සිම ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
14. පෑලියගොඩ, මීගමු පාර, නො. 168 හි පිහිටි මතුරට ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
15. කොළඹ 12, ඩෑම් වීදිය, නො. 280 හි පිහිටි මල්වත්ත වැලි ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
16. මහරගම, නාවින්න, හයිලෙවල් පාර, නො. 310 හි පිහිටි මස්කෙලිය ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
17. මහරගම, නාවින්න, හයිලෙවල් පාර, නො. 310 හි පිහිටි නමුණුකුල ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
18. පෑලියගොඩ, මීගමු පාර, නො. 168 හි පිහිටි පුස්සැල්ලාව ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
19. කොළඹ 10, ෆෝස්ටර් පටුමග, නො. 25 හි පිහිටි තලවකැලේ ටී එස්ටේට්ස් පී.එල්.සී
20. ඉංගිරිය, නම්බපාන, තැ.පෙ. 02 හි පිහිටි උඩුපුස්සැල්ලාව ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
21. කොළඹ 03, ධර්මපාල මාවත, නො. 60 හි පිහිටි වටවල ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී
22. කොළඹ 01, ආදිපාද වීදිය, නො. 11 හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
23. කොළඹ 02, වොක්ෂෝල් වීදිය, නො. 55/75, ජනතා වතු සංවර්ධන මණ්ඩලය

අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.09.23 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 නොවැම්බර් මස 14 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

---

යොමු අංකය : IR/07/08/2011.

**කාර්මික අධිකරණයේ දී ය**

ලංකා වතු සේවා සංගමය,
අංක 06, ඇලෝයි මාවත,
කොළඹ 03.

*පළමු පාර්ශ්වය*

නඩු අංකය A - 3490 සහ

1. අගලවත්ත ප්ලාන්ටේෂන් පී.එල්.සී, නො. 10, ඥානාර්ථ ප්‍රදීප මාවත, කොළඹ 08.
2. අගරපතන ප්ලාන්ටේෂන් පී.එල්.සී, නො. 53 - 1/1, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.
3. බලංගොඩ ප්ලාන්ටේෂන් පී.එල්.සී, තැ.පෙ. 06, පාම්ගාඩින්, රත්නපුර.
4. බොගවන්තලාව ටී.එස්ටේට් පී,එල්.සී, නො. 153, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
5. ඇල්පිටිය ප්ලාන්ටේෂන් පී.එල්.සී, 9 වන මහල, එයිට්කන්ස්පෙන්ස් ටවර්, නො. 305, වෝක්ෂෝල් වීදිය, කොළඹ 02.
6. ඇල්කඩුව ප්ලාන්ටේෂන් ලිමිටඩ් ජනවතු පියස, නො. 320, ටී. බී. ජායා මාවත, කොළඹ 10.
7. හපුගස්තැන්න ප්ලාන්ටේෂන් පී.එල්.සී, තැ.පෙ. 02, නම්බපාන, ඉංගිරිය.
8. හොරණ ප්ලාන්ටේෂන් පී.එල්.සී, නො. 08, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.
9. කැළණි වැලි ප්ලාන්ටේෂන් පී.එල්.සී, නො. 400, ඩීන්ස් පාර, කොළඹ 10.

10. කැගල්ල ප්ලාන්ටේෂන් පී.එල්.සී., නො. 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම.
11. කොටගල ප්ලාන්ටේෂන් පී.එල්.සී., නො. 53-1/1, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.
12. කහවත්ත ප්ලාන්ටේෂන් පී.එල්.සී., නො. 52, මාලිගාවත්ත පාර, කොළඹ 10.
13. මඩොල්සිම ප්ලාන්ටේෂන් පී.එල්.සී., හිඟුරුගම සංකීර්ණය, බදුල්ල.
14. මතුරට ප්ලාන්ටේෂන් පී.එල්.සී., නො. 168, මීගමු පාර, පැලියගොඩ.
15. මල්වත්ත වැලි ප්ලාන්ටේෂන් පී.එල්.සී., නො. 280, ඩැම් වීදිය, කොළඹ 12.
16. මස්කෙළිය ප්ලාන්ටේෂන් පී.එල්.සී., නො. 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම.
17. නමුණුකුල ප්ලාන්ටේෂන් පී.එල්.සී., නො. 310, හයිලෙවල් පාර, නාවින්න. මහරගම.
18. පුස්සැල්ලාව ප්ලාන්ටේෂන් පී.එල්.සී., නො. 168, මීගමු පාර, පැලියගොඩ.
19. තලවකැලේ ටී.එස්ටේට්ස් පී.එල්.සී. නො. 25, ෆෝස්ටර් පටුමග, කොළඹ 10.
20. උඩුපුස්සැල්ලාව ප්ලාන්ටේෂන් පී.එල්.සී., තැ.පෙ. 02, නම්බපාන, ඉංගිරිය.
21. වටවල ප්ලාන්ටේෂන් පී.එල්.සී., නො. 60, ධර්මපාල මාවත, කොළඹ 03.
22. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, නො. 11, ආදිපාද වීදිය, කොළඹ 01.
23. ජනතා වතු සංවර්ධන මණ්ඩලය, නො. 55/75, වෝක්ෂෝල් වීදිය, කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධ

**ප්‍රදානය**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2013.01.08 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :

2011 අංක 22 දරන සාමූහික ගිවිසුම මගින් 2011.04.11 වැනි දින සිට වතු කම්කරුවන්ගේ දෛනික වැටුප් වැඩි කිරීම හේතුවෙන් ඔවුන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය කරමින් ඔවුනට වඩා ඉහල සේවා තත්ත්වයන්හි සේවයේ නියුතු ඉහත නම් සඳහන් ප්‍රාදේශීය වැවිලි සමාගම් විසි එකෙහි (21) සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් තේ, රබර්, පොල්, ඔයිල් පාම් යන ප්‍රධාන වැවිලි භෝග වලින් සමන්විත වතුයායන්වල කාර්ය මණ්ඩල සේවකයින්ගේ වැටුප් විෂමතාවයක් හටගෙන ඇත්ද යන්න හා එසේ හටගෙන ඇත්නම් ඔවුනට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

*පෙනී සිටීම :*

01 වන පාර්ශ්වය වෙනුවෙන් ලංකා වතු සේවා සංගමයේ සහකාර ලේකම්, (කම්කරු සම්බන්ධතා) බන්දුල ගමගේ මහතා පෙනී සිටියි. 01 වන පාර්ශ්වය වෙනුවෙන් ලංකා වතු සේවා සංගමයේ සභාපති ධම්මික ජයවර්ධන මහතා සහ ප්‍රධාන ලේකම් කිංස්ලි ආර්. රොබට් මහතා සහ උපසභාපති චතුර සමරසිංහ මහතා පෙනී සිටියි. 02 වන පාර්ශ්වයේ වැවිලි සමාගම් 01 සිට 21 ක නියෝජනය කරමින් ලංකා සේව්‍ය සම්මේලනයේ සහකාර නියෝජ්‍ය නිතිඥ ප්‍රසාද් ද සිල්වා මහතා පෙනී සිටියි. 22 අංකය යටතේ 02 වන පාර්ශ්වයේ 02 වන කොටස වන ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් කිසිවෙක් පැමිණ නැති අතර නියෝජනයක් ද නොමැත. එසේම 23 වන අංකය යටතේ 02 වන පාර්ශ්වයේ 03 වන කොටස වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් කිසිවෙක් පැමිණ නැති අතර පෙනී සිටිමක් ද නොමැත.

පාර්ශ්වයන් විසින් විධිමත් ලෙස ප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2013 ජුනි මස 10 වන දින ප්‍රාථමික විරෝධතාවය සහ ප්‍රතිවිරෝධතාවය සම්බන්ධව දිනයක් දී 2013 ජුනි මාසයේ මේ සම්බන්ධව නියෝගයකට නියම කර ඇත. 2013. 06 වන මාසයේ 25 වන දින කාර්ය සටහන් මෙසේය.

අද දින මෙම ආරවුල සම්බන්ධයෙන් ප්‍රාථමික ප්‍රදානයට නියම කර ඇත. මේ අවස්ථාවේදී 02 වන පාර්ශ්වයේ 02 වන වගඋත්තරකරුගේ ලිඛිත දේශනය 01 වන වගඋත්තරකාර පාර්ශ්වයට භාරදෙමි. එසේම 03 වන පාර්ශ්වකරුගේ ලිඛිත දේශන 01 පාර්ශ්වයට සහ 01 වන වගඋත්තරකාර පාර්ශ්වයට භාරදෙමි. දෙවන පාර්ශ්වයේ දෙවන වගඋත්තරකරු සහ දෙවන පාර්ශ්වයේ තුන්වන වගඋත්තරකරුවන් වෙනුවෙන් කිසිවෙක් පැමිණ නොමැති අතර පෙනී සිටීමක් ද නොමැත. අධිකරණයේ පෙනි සිටිමට අවශ්‍ය නම් අද දින පෙනී සිටීම සඳහා හේතු දක්වා ඉදිරිපත්වීමට පාර්ශ්වකරුවන්ට ලියාපදිංචි තැපෑලෙන් නිවේදන යවා ඇත. දෙවන පාර්ශ්වයේ පළවන වගඋත්තරකරුගේ දේශනයෙන් පෙනී යන ආකාරයෙන් 2013.04.05 වන දින යම් ගිවිසුමක් අත්සන් කර ඇති බව සඳහන් කර ඇත. ඒ සඳහා අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කර ඇත. එයින් පිටපත් නිකුත් කර නැති බවද 2013.09.30 න් පසුව නව ගිවිසුමක් අත්සන් කරන්නට ඉඩ ඇති හෙයින් මෙම නඩුව ඒ කාලය වනතුරු පසෙක තබමි.

කෙසේ වෙතත් 2013.09.09 වන දින 01 වන පාර්ශ්වය විසින් ලියාපදිංචි තැපෑලෙන් එවන ලද ලිපියේ කරුණු සලකාබලා මේ නඩුව අද දින එනම් 2013.09.23 වන දින කැඳවන ලදී. නඩුවේ කරුණු සලකා බැලීමේදී 01 පාර්ශ්වකරු මේ නඩුවේ කැමැත්තෙන් ඉල්ලා අස්කර ගැනීමට ඉල්ලීම් කර ඇති නිසාත් 02 වන පාර්ශ්වයේ 01 වන කොටස ද ඊට විරුද්ධත්වයක් පළ නොකරන බව කියා සිටියි. 02 වන පාර්ශ්වයේ 02 වන කොටස (අංක 22) සහ 02 වන පාර්ශ්වයේ 03 වන කොටස වන (අංක 23) අද දින පැමිණ සිටියේ නැත. පෙනී සිටීමක් ද නැත. කෙසේ වෙතත් ලියාපදිංචි තැපෑලෙන් සියලු පාර්ශ්වකරුවන්ට නිවේදන යවා ඇත.

කරුණු මෙසේ හෙයින් 01 වන පාර්ශ්වයේ ඉල්ලීමට ඉඩ දෙමි.

ඒ අනුව සියලු කරුණු සලකාබලා මට පෙනී යන ආකාරයට ප්‍රදානයක් කිරීමට ඉඩ නැත. ඒ අනුව ප්‍රදානය නොකරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත බව මාගේ නිගමන වේ.

ටී. එඩ්මන්ඩ් සාන්තරාජන්,
(බේරුම්කරු).

2013 සැප්තැම්බර් මස 23 වන දින,
කාර්මික අධිකරණයේ දී ය.

12-1035

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.